# උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය
# පුරප්පාඩු
# ප්‍රධාන විධායක නිලධාරී (මාර්ෂල්) තනතුර (HM 1-3)

උපරිමාධිකරණ සංකීර්ණය සහ එහි ගොඩනැගිලි පාලනය කිරීම, පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීමද සංකීර්ණයේ සහ මණ්ඩලයට අයත් අනෙකුත් ගොඩනැගිලි වල ඇති පහසුකම් වැඩි කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි ඊට අලුතින් කොටස් එකතු කිරීම, වෙනස් කිරීම සහ ඒවා වැඩිදියුණු කිරීමද මණ්ඩලයේ පරමාර්ථ වන අතර එම පරමාර්ථ ඉටුකර ගැනීම සහ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් නිලධරයන් සහ සේවකයින් පත් කිරීම සහ අදාළ නිලධරයන් සහ සේවකයන් පිළිබඳව සියළු පාලන කටයුතු කිරීම කළමනාකරණ මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා (මාර්ෂල්) විසින් සිදුකරනු ලැබේ.

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී (මාර්ෂල්) තනතුරු පුරප්පාඩුව පිරවීම සඳහා පහත පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්**

(පහත සඳහන් 1 හෝ 2)

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලනය / ව්‍යාපාර කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය / රාජ්‍ය කළමනාකරණය / මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම. (Bachelor Degree)

   සමඟ

   ව්‍යාපාර පරිපාලනය / ව්‍යාපාර කළමනාකරණය / රාජ්‍ය කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම.

   සහ

   රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකාරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 15 පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

   සමඟ

   රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක 'කළමනාකරණ' මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

සැ.යු:- ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙක් වීම (යුධ හමුදාවේ බ්‍රිගේඩියර් නිලයට නොඅඩු නිලයක හා ඊට සමාන ත්‍රිවිධ හමුදා නිලයේ) හෝ නීතිඥයෙක් වශයෙන් කටයුතු කර තිබීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමේදී අතිරේක අධ්‍යාපන/වෘත්තීය සුදුසුකමක් ලෙස සැලකේ.

**වයස** - අවු.35 ට නොඅඩු හා අවු.55 ට නොවැඩි විය යුතුය

**මාසික වැටුප** - HM 1-3-2016 (86,865-15x2,270 – 120,915/=)
(රජයේ බදු ප්‍රතිපත්ති වලට යටත්ව)

**පොදු කොන්දේසි**

අ. සෑම ඉල්ලුම්කරුවෙක්ම

- I ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- II තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III විශිෂ්ය චරිතයෙන් යුක්ත විය යුතුය.

ආ. මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර විශ්‍රාම වැටුප් රහිතය. ස්ථාන මාරුවීම් නොමැත.

ඇ. සියලු අයදුම්කරුවන් කළමනාකාර මණ්ඩලය මගින් තීරණය කරනු ලබන පරිදි ලිඛිත / ප්‍රායෝගික හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පසු තෝරා ගැනීම සිදු කෙරේ.

ඈ. සේ.අ.අ. සඳහා වැටුපෙන් 10% ක මුදලක් සේවා දායකයා විසින් ගෙවිය යුතු අතර, සේ.අ.අ. සඳහා 12% ක සහ සේ.නි.භා.අ. සඳහා 3% ක මුදලක් සේවායෝජකයා විසින් දායක මුදල් ලෙස ගෙවනු ලැබේ.

ඉ. තෝරා ගන්නා අයදුම්කරුහට නිල රථයක් සහ අනුමත සීමාවට යටත්ව ඉන්ධනද (රජයේ බඳු ප්‍රතිපත්ති වලට යටත්ව) දුරකථන දීමනා සහ වෛද්‍ය / හදිසි අනතුරු රක්ෂණ පහසුකම්ද වෙනත් අනුමත ප්‍රතිලාභද හිමිවේ.

ඊ. සම්පූර්ණ ජීව දත්ත සහිත අයදුම්පතෙහි වයස, සුදුසුකම්, පුහුණුව, සේවා පලපුරුද්ද, දරණ ලද පෙර තනතුරු සහ ඒ සඳහා බැඳුණු හා ඉවත් වූ දිනයන් යන කරුණු ඇතුලත් කොට සහතිකවල සහතික කරන ලද පිටපත් හා ඔබ පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංකයන් ද සහිතව අයදුම්පත් යොමු කල යුතුය. (සහතිකපත් වල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)

රාජ්‍ය අංශයේ ආයතනවල අයදුම්කරුවන්ගේ අයදුම්පත්, අදාල ආයතන ප්‍රධානියා මාර්ගයෙන් යොමු කළ යුතුය. අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහල කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු අතර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත **2023.03.31** දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

ප්‍රධාන විධායක නිලධාරී/මාර්ෂල්

උපරිමාධිකරණ සංකීර්ණය කළමනාකරණ මණ්ඩලය

උපරිමාධිකරණ සංකීර්ණය

තැ.පෙ.223, කොළඹ 12.